**සමන්තුරෙයි ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට සමන්තුරෙයි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව 2017, 2018 සහ 2019 වර්ෂවල වෙන්දේසි කරන ලද සහ විනාශ කරන ලද කාර්යාල ලී බඩු, උපකරණ සහ පුස්තකාල පොත්වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | වෙන්දේසි කරන ලද සහ විනාශ කරන ලද භාණ්ඩවල පිරිවැය ගිණුම්වලින් ඉවත්කළ යුතු වේ. | පුස්තකාල පොත්වල පිරිවැය ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරන අතර, කාර්යාල ලී බඩු සහ උපකරණ කපා හැරීමට ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමේ කටයුතු නිමවූ පසු මෙම භාණ්ඩවල පිරිවැය ස්ථාවර වත්කම් ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරමි. |
| (ii) | සභාවට පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබූ රු.200,000 ක් වටිනා ඉඩම ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉඩම ගිණුම්ගත කළ යුතු වේ. | මෙම ඉඩමේ වටිනා කම ඉදිරි ගිණුම් වර්ෂයේදි ඉඩම් යටතේ ස්ථාවර වත්කම් වශයෙන් පෙන්වීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (iii) | රු.948,717 ක් වැයකර ඉදිකළ මහජන පුස්තකාලයේ වැසිකිළිය ගිණුම්වලට ගෙන නොතිබුණි. | වැසිකිළිය ගිණුම්ගත කළ යුතු වේ. | අදාල කර්මාන්තය සඳහා ගෙවීම් අදාල මුදල් වර්ෂයතුල නොකළ නිසා මූල්‍ය ප්‍රකාශනවල වැරදීමකින් පෙන්වීමට නොහැකි විය. මෙය ඉදිරි වර්ෂයේදි නිවැරදි කරමි. |
| (iv) | 2019 වර්ෂයට අදාල හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.60,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදාල හිඟ මුදල මූල්‍ය ප්‍රකාශනයේ පෙන්විය යුතු වේ. | මෙය වැරදීමකින් සිදුවී ඇත. මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරන ලෙස විෂය භාර නිලධාරි දැනුවත් කර ඇත. ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. |

**(ආ) නොසැසඳූ ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු මූල්‍ය ප්‍රකාශන අනුව රු.14,422,133 ක් වුවද, අදාල ලේඛන අනුව රු.21,366,064 ක් වූ හෙයින් රු.6,943,931 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම්වල ගැලපීම් කිරිමට කටයුතු කළ යුතුවේ. | මෙදිනට ලේඛනයේ හිඟ මුදල නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවති. එම නිම කිරීමේ කටයුතු 2020.07.06 දිනට නිමකර දෙන ලෙස විෂය භාර නිලධාරියා වෙත ඉදිරිපත් කර ඒ අනුව අවශ්‍ය කටයුතු කෙරමින් පවතී. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති විම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.29,811,585 ක් වටිනා ස්ථාවර වත්කම් වලට අදාලව ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, හිමිකම් පොත්, පරිග්‍රහණ ලේඛන හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම්වල ඔප්පු ලබා ගැනීම සඳහා නොයෙකුත් කටයුතු කළ අතර අදාල ආයතනවලින් පිළිතුරු ලැබූ පසු මෙම අඩුපාඩු නිවැරදි කරනු ලැබේ.<br><br>ස්ථාවර වත්කම්වල වටිනාකම සටහන් කිරීමේ කටයුතු නිමවූ පසු ඉදිරිපත් කරමි.<br><br>විස්තරාත්මක උප ලේඛන මාර්ග, පොදු ලිං යනාදිය ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමේ ගැටළු හේතුවෙන් ස්ථාවර වත්කම් ලැයිස්තුවට ඇතුළත් නොකෙළමි.<br><br>ඉදිරි කාලවලදි මාර්ග, පොදු ලිං මූල්‍ය ප්‍රකාශනවල විස්තරාත්මකව පෙන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ රු.1,184,366 ක් වටිනා තැන්පත් 84 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | 2015.12.31 දින දක්වා ආපසු ලබා නොගත් කල් ඉකුත්වූ තැන්පත් සියල්ල ආදායමට මාරු කර ඇත. |

### 1.4.2 බදු අවශ්‍යතාවන්හට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේදී අයකර තිබූ රු.260,154 ක වැට් බදු, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාල කාල පරිච්ඡේදයේ දී ප්‍රේෂණය කළ යුතු වේ. | අදාල දිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුමේ වැට් ලියාපදිංචි වූ බවට සහතික ඉදිරිපත් නොකිරීම නිසා එම මුදල රඳවා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,466,546 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,943,411 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,349,858 | 4,371,246 | 6,158,446 | 12,634,933 | 3,907,719 | 4,329,859 | 3,313,089 | 14,422,133 |
| කුලී | 31,006,570 | 26,206,228 | 26,232,708 | 8,451,541 | 20,271,858 | 20,361,397 | 20,873,137 | 8,478,021 |
| බලපත්‍ර ගාස්තු | 1,300,000 | 1,625,550 | 1,625,550 | -- | 1,300,000 | 1,408,166 | 1,408,166 | -- |
| වෙනත් ආදායම් | 27,600,000 | 26,898,367 | 26,898,367 | -- | 20,640,000 | 22,315,754 | 22,315,754 | -- |
| | 64,256,428 | 59,101,391 | 60,915,071 | 21,086,474 | 46,119,577 | 48,415,176 | 47,910,146 | 22,900,154 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 අප්‍රේල් 26 වන දිනැති අංක 1808 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට්පත්‍රය අනුව, සහා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 22 ක නව දේපළ තක්සේරු කිරීම සඳහා ප්‍රකාශයට පත්කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දේපල තක්සේරු කිරීමේ කටයුතු නිමකර නොතිබුණි. | අදාල දේපළ තක්සේරු කිරීම් නිම කර වරිපනම් බදු අයකිරීම කටයුතු කළ යුතුවේ. | අදාල ගැසට් නිවේදනය අනුව 2018 වර්ෂයේ සිට දේපළ අංක කර, එම කටයුතු 2019 අගෝස්තු මස නිම කර මඩකලපුව ප්‍රධාන තක්සේරු දෙපාර්තමේන්තුවට වරිපනම් බදු තක්සේරු කරන ලෙස දැනුම් දෙන ලදි. ගරු. සභාපතිතුමා කිහිප වතාවක්ම එහි ගොස් විමසුවද, තක්සේරු දෙපාර්තමේන්තුවේ පවතින නිලධාරි හිඟය නිසා අදාල කටයුතු කිරීම ප්‍රමාද වීමට ඉඩ ඇති බව දන්වා තිබුණි. ඒ නිසා සභාවේ ආදායම සම්බන්ධයෙන් අවධානය යොමුකර සභාවේ සේවය කරන ආදායම් පරීක්ෂකවරයා යටතේ කමිටුවක් පත්කර තාවකාලිකව තක්සේරු කටයුතු කෙරමින් පවති. |

### 2.2.3 බදුකුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය දක්වා බදුදී තිබූ මස් කඩවලින් අයවිය යුතු රු.1,751,340 ක හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදුකුලී අයකිරීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතුවේ. | 2015, 2016,2017 සහ 2018 වර්ෂවල හිඟ මුදල් අයකර ගැනීම සඳහා කල්මුනේ දිස්ත්‍රික් උසාවියේ නඩු 06 ක් ද, සමන්තුරේ සමථ මණ්ඩලයේ නඩු 16 ක් ද විභාග වෙමින් පවති. අනිකුත් ගව මස් කඩ හිමියන් මාසිකව රු. 10,000 ක් බැගින් ගෙවමින් පවති. |

**2.2.4 කඩ කාමර කුලි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමන්තුරෙයි පොදු වෙළඳපොල ගොඩනැගිල්ල, හිජ්රාපුර පොදු වෙළඳපොල ගොඩනැගිල්ල සහ පරණ මාර්කට් ගොඩනැගිල්ල යන ස්ථානවලින් ලැබිය යුතු හිඟ කඩකාමර කුලි පිළිවෙලින් රු.1,002,281 ක්, රු.18,000 ක්, රු.43,400 ක් සහ රු.67,070 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර යුතු වේ. | ලැයිස්තුවේ සඳහන් මුදල තක්සේරු කිරීමේදි සිදුවූ සමහර දෝෂ, වසා තිබූ කඩ කාමර වල නියමිත හිඟ බදු ප්‍රමාණය ගණනය කිරීමේදි ගැටළු මතුවී ඇත. දැනට හිඟ මුදල් අයවෙමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය අනුව, ප්‍රාදේශිය සභාවේ අදායම් විධිමත් කිරීම ඇතුළු ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ක්‍රියාත්මක කළ යුතුව තිබූ නමුත්, අතුරු ව්‍යවස්ථා 10 ක් සඳහා යෝජනා නැගෙනහිර පළාත් පාලන ඇමතිවරයා වෙත අනුමැතිය සඳහා යවා තිබුණි. එහෙත් 2019 දෙසැම්බර් 31 දින දක්වා අතුරු ව්‍යවස්ථා 04 ක් සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | පනත අනුව ප්‍රධාන අතුරු ව්‍යවස්ථා පනවා අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් යෝජනා අනුමැතිය සඳහා අදාල ස්ථාවලට ඉදිරිපත් කළද, මේ දක්වා අනුමැතිය ලැබී නොතිබුණි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. |

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා 06 අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | අනුමැතිය ලද අතුරු ව්‍යවස්ථා 06 සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කාර්යාල ගොඩනැගිලි, මහජන පුස්තකාල, මහජන පොල, මහජන ක්‍රීඩාංගන, පොදු සුසානභූමි, කටු ඇඹරුම් කර්මාන්ත, ළමා උද්‍යාන, ප්‍රජා මධ්‍යස්ථාන සහ සත්ව ඝාතනාගාර යන ස්ථාන පිහිටුවා තිබෙන ඉඩම් වල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඔප්පු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළයුතුවේ. | මේ සම්බන්ධයෙන් කටයුතු කර ඉදිරි කාලවලදී සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වන කාල පරිච්ඡේදයේ පුද්ගලයන් 08 දෙනෙකුගෙන් වැඩියෙන් අයකර ගෙන තිබූ සේවක අර්ථසාධක මුදලේ දායක මුදල් රු.126,988 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වැඩිපුර අයවීම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | මෙය සභාවේ ආදායමට මාරු කිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 14 ක් සම්පූර්ණ කර නොතිබුණි. සංවර්ධන නිලධාරි 01 අයකු වැඩිපුර බඳවාගෙන තිබුණි. | අදාල පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල පුරප්පාඩු වෙනුවෙන් නිලධාරින් මේදක්වා මාරුවීම් මගින් හෝ ස්ථිර පත්වීම් මගින් සම්පූර්ණ කර නොතිබුණි. මෙම පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස කීපවතාවක් ලිඛිතව උසස් නිලධාරීන් දැනුවත් කළද, මේ දක්වා එලාදායී පිළිතුරක් නොලැබුණි. |
| (ආ) | 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.77,552 ක හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල නිලධාරීන් පසුගිය වර්ශ 10 ට වැඩි කාලයක් සභාවේ සේවය නොකරන අය වෙන අතර, එම නිලධාරීන් දැනට සේවය කරනවාද නැතහොත් විශ්‍රාම ගොස් තිබේද යන්න සොයා බලා ඒ අනුව කටයුතු කරමි. |

**3.4 ප්‍රසම්පාදන**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සැපයුම් හා සේවා සහ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 23.4 ක්ද, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 14.5 ක්ද වැය කර තිබුණද, ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් වාර්ෂිකව සකස් කළ යුතු වේ. | මේ පිළිබඳ පුහුණු නිලධාරින් ස්ථාන මාරුවී ගොස් ඇති බැවින් මෙය සකස් කිරීමේදී ප්‍රමාදයක් සිදුවිය. දැනට ප්‍රසම්පාදන සැලැස්ම සකස්කිරීමේ කටයුතු අවසන් අධියරට පැමිණී ඇත. ඉදිරියේදී මෙම ප්‍රසම්පාදන සැලසුම් වාර්ෂිකව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1999 වර්ෂයේ ඉදිකරන ලද සභාවේ හිජ්රා මහජන පොළෙහි කඩ කාමර 84 ක් බදු දීම සම්බන්ධයෙන් විගණනය වෙත ලැබුණු ලිඛිත ප්‍රකාශය අනුව මෙම පොළට අසල පිහිටි පුද්ගලික කඩ කාමර මාසිකව රු.6,000 ක් රු.20,000 ක් අතර පරාසයක් බදු දී තිබුණද, සභාව සතු මෙම කඩකාමර අළුතින් මිල කැඳවීම් නොකර රු. 585 සිට රු.3,335 දක්වා පරාසයකට බදු දීමෙන් වාර්ෂික රු.2,700,000 ක් පමණ මුදලක් සභාවට අහිමිවී තිබුණි. | කඩ කාමරවල කුලී නැවත තක්සේරු කර බදු ගිවිසුම් අලුත්කර ගිවිසුම් කොන්දේසියවලට අනුකූලව කඩ කාමර බදු දිය යුතුවේ. | අදාල කඩ කාමරවල බදු කුලී තක්සේරු සඳහා 2019.02.21 දින තක්සේරු නිලධාරීන් තක්සේරු කර ඇති අතර, එම වාර්තාව මෙතෙක් ලැබී නොතිබුණි. එම වාර්තා ලද විගස මාසික කුලිය වැඩි කර අයකිරීමට කටයුතු කරමි. |
| (ආ) | අත්තිකාරම් ගෙවීම සම්බන්ධයෙන් නිරවුල් කළයුතු අත්තිකාරම් රු.580,277 ක් සම්බන්ධයෙන් සනාථකළ හැකි ලියවිලි කිසිවක් නොමැතිව සහ මෙම මුදල නිරවුල් කිරිමට කටයුතු නොකර වර්ෂ 14 කට වඩා වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වමින් තිබුණි. | අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට / ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් ලියවිලි නොමැතිවීම නිසා නිරවුල් කිරීමට නොහැකිව ඇත. ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරමි. |